## ශීර්ෂය 326 - ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 326 - ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 ජුනි 12 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජූලි 11 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

#### (අ) පුනරාවර්තන වියදම්

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ පුනරාවර්තන වියදම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩුව නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ වියදම් ප්‍රකාශයට (ACA 2(ii)) අනුව පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් වෙනුවෙන් මුදලින් දරන ලද වියදම රු.483,270,594 ක් වුව ද, මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් ලෙස වෙනත් දෙපාර්තමේන්තුවක් විසින් දරන ලද රු.313,630 ක වියදම ද ඇතුළත්කර රු.483,584,224 ක් ලෙස සටහන්කර තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය මුද්‍රණය කරන අවස්ථාවේ සිදු වී ඇති ප්‍රමාද දෝෂයක් හේතුවෙන් සිංහල භාෂාවෙන් සකස්කර ඇති මූල්‍ය ප්‍රකාශනයේ පමණක් මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් ලෙස වෙනත් දෙපාර්තමේන්තුවක් විසින් දරන ලද රු.313,630 ක වියදම ද ඇතුළත්කර රු.483,584,224 ක් ලෙස සටහන්කර ඇති අතර, නිවැරදි වියදම වූ රු.483,270,594 ක් දෙමළ හා ඉංග්‍රීසි භාෂාවෙන් සකස්කර ඇති මූල්‍ය ප්‍රකාශනවල සටහන්කළ බව දන්වා තිබුණි. | නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කිරීමට වගබලා ගත යුතු ය. |

#### (ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කේවල ශේෂ වර්ගීකරණ සාරාංශය තුළ ඇතුළත් නිලධාරීන් තිදෙනෙකුගේ එකතුව රු.437,611 ක් වූ ආපදා ණයශේෂ සාමාජික ණය ලේඛනය (CC 10) තුළ ඇතුළත්වී නොතිබුණි. | අදාළ නිලධාරීන්ගේ ණයශේෂයන් සාමාජික ණය ලේඛනයේ සටහන් කිරීමට කටයුතුකරන බව දන්වා තිබුණි. | සාමාජික ණය ලේඛනය නිවැරදිව පවත්වාගෙන යාමට කටයුතු කළ යුතු ය. |

**(ඈ) දේපල පිරියත හා උපකරණ**

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩුව නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 වර්ෂයේ දී අධිකරණ අමාත්‍යාංශයෙන් පවරාගන්නා ලද වාහනයක් 2021 වර්ෂයේ දී රු.4,750,000 කට ඇස්තමේන්තු කළ ද, එහි වටිනාකම මූල්‍ය නොවන වත්කම්වලට ගිණුම්ගත නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දේපල, පිරියත හා උපකරණවල වටිනාකම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | 2023 වර්ෂයේ ජුනි මස දී මෙම රථය මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කිරීමට කටයුතුකරන බව දන්වා තිබුණි. | වත්කම්වල නිවැරදි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතු ය. |

**(ඈ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | **හානි පිළිබඳ ලේඛනය**<br>මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | මේ වන විට හානි පිළිබඳව විස්තර සටහන්කර ගැනීමට අවශ්‍ය ලේඛන හා පොත්පත් 02 ක් සකස්කර ඇතිබව දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව හානි හා පාඩු ලේඛනයක් පවත්වා ගෙන යා යුතු ය. |
| (ii) | **වාහන ලොග් පොත**<br>මුදල් රෙගුලාසි 1645(අ) පරිදි දෙපාර්තමේන්තුවේ වාහන 04 කට අදාළ ලොග් පොත් යාවත්කාලීනකර නොතිබුණි. | 2023 වර්ෂයේදී යාවත්කාලීන කිරීමට කටයුතුකරන බව දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි 1645(අ) හි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව පොදු 267 ආකෘතිය ප්‍රකාරව වාහන ලොග් පොත් සෑම වාහනයක් සම්බන්ධයෙන්ම පවත්වා ගත යුතු ය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 හා 2022 අප්‍රේල් 26 දිනැති රාජ්‍ය වියදම් පාලනය කිරීම පිළිබඳ චක්‍රලේඛයෙහි 03 (xvii) වගන්තිය අනුව වර්ෂය තුළ වියදම් දැරීම සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදනවල ඉතිරිවීම් ඇත්නම්, ඒවා වර්ෂය අවසන්වීමට පෙර වෙනත් වියදම් සඳහා යොදවා නොගත යුතු වුව ද, සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 4 ක් සඳහා මුදල් රෙගුලාසි 66 යටතේ රු.15,030,000 ක ප්‍රතිපාදන මාරුකරගෙන තිබුණි. වැය විෂයයන් අතර එලෙස මාරුකිරීමේ ප්‍රතිශතය සියයට 29 සිට සියයට 231 අතර පරාසයක් ගෙන තිබුණු අතර එලෙස ලබාගත් රු.15,030,000 ක ප්‍රතිපාදනවලින් සියයට 5 සිට සියයට 52 දක්වා පරාසයක ඉතිරිවීම් පැවතුණි. | මෙම වැය විෂයයන් සඳහා දෙපාර්තමේන්තුව මගින් සිදුකළ ඇස්තමේන්තුවලට සාපේක්ෂව අයවැය ප්‍රතිපාදන අඩුවෙන් ලැබීම, ඒ වෙනුවෙන් අමතර ප්‍රතිපාදන ලබාදීමක් ද සිදු නොවීම සහ රටේ පවතින ආර්ථික අර්බුදය හමුවේ භාණ්ඩ හා සේවාවන්වල මිල ගණන් දිනෙන් දින ඉහළ යෑම හේතුවෙන් ඉතා අත්‍යාවශයෙන්ම පවත්වාගෙන යා යුතු සේවාවන් පවත්වාගෙන යාමට අයවැය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් අවශ්‍ය ප්‍රතිපාදන මු.රෙ. 66 යටතේ ප්‍රතිපාදන මාරුකිරීම මගින් සිදුකර ඇති බව දන්වා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

### 2.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී / ගණන්දීමේ නිලධාරී විසින් සිදුකළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතිකවීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතුකර නොතිබුණි.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතිකවිය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කරගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදුකළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා ක්‍රියාත්මක අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණක නිලධාරියෙකු නොමැති වුව ද, අධිකරණ අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ සහභාගීත්වයෙන් 2023 වර්ෂයේ දී විගණන හා කළමණාකරන කමිටු රැස්වීම් 02 ක් පවත්වා ඇති අතර, ඒ අනුව මෙම පද්ධතියේ සඵලතාවය පිළිබඳව සමාලෝචනය කිරීම සිදුකර ඇති බව දන්වා තිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ii) | අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටුකර නොතිබුණි. | දැනට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණක තනතුර සඳහා නිලධාරියෙකු පත් කිරීමට ඉල්ලීම් කර ඇති බව දන්වා තිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහකර දැක්වේ.

| | නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| (i) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| | මු රෙ 103 (1) (ඉ) | මුදල් රෙගුලාසි පරිදි හානි හා පාඩු ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | මේ වන විට හානි පාඩු ලේඛණයක් සකස් කර ඇති බව දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| | මු රෙ 103 හා 104 | පුත්තලම ප්‍රජා විශෝධන කාර්යාලයේ ඇති වූ ගින්න හේතුවෙන් විනාශ වූ භාණ්ඩ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතුකර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් මු රෙ 103 හා 104 අනුව කටයුතු කිරීම සඳහාත් මෙම ගිනිගැනීම සම්බන්ධයෙන් නිලධාරියෙකු සම්බන්ධතාවයක් පවතීද / නැතිද යන්න විමර්ශනය කර වාර්තාවක් ලබාගැනීම සඳහාත් මේ වන විට නැවත කමිටුවක් පත්කර ඇති බව දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| | මු රෙ 227 | මුදල් රෙගුලාසි පරිදි ගෙවීම් වවුචර්වල වැය විස්තර සටහන් කර නොතිබුණි. | 2023 වර්ෂයේ සිට නිවැරදි කිරීමට කටයුතුකරන බව දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| | මු රෙ 756 (6) | චක්‍රලේඛය පරිදි නියමිත දිනට භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල පත් කිරීමට කටයුතු කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය, පළාත් කාර්යාල 09 සහ ප්‍රාදේශීය කාර්යාල 115 ක භාණ්ඩ සමීක්ෂණ කටයුතු මේ වන විට අවසන්කර ඇති අතර, ඉන් කාර්යාල 88 ක කිසිදු නිර්දේශයක් සිදුකිරීමට නොමැති අතර, කාර්යාල 27 ක මේවන විට නිර්දේශ ක්‍රියාත්මක කරමින් පවතින බව දන්වා තිබුණි. | චක්‍රලේඛය පරිදි කටයුතු කළ යුතු ය. |

(ii) **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

| | | | |
|---|---|---|---|
| **2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛය** | | | |
| **5.1 ඡේදය** | ඉන්ධන ප්‍රමාණය සහ ධාවනය කරනලද දුර ප්‍රමාණය ලොග් සටහන් පොතෙහි දිනපතා ඇතුළත් කළ යුතු වුව ද, එසේ සිදුකර නොතිබුණි. | 2023 ජුනි මස සිට අවශ්‍ය කටයුතු සිදුකරන බව දන්වා තිබුණි. | චක්‍රලේඛය පරිදි කටයුතු කළ යුතු ය. |
| **3.1 ඡේදය** | වාහන 04 කට අදාළව ඉන්ධන පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. | ඉන්ධන නිකුත් කිරීම කෝටා ක්‍රමය අනුව සිදුකිරීම හේතුවෙන් ඉන්ධන පරීක්ෂාව සිදුකිරීමට නොහැකි වූ බවත්, මේවන විට ඉන්ධන කෝටාව ඉහල දමා ඇති බැවින් 2023 ජුනි මස ඉන්ධන පරීක්ෂාව සිදුකිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බවත් දන්වා තිබුණි. | චක්‍රලේඛය පරිදි කටයුතුකළ යුතු ය. |

(iii) **රාජ්‍ය මුදල් චක්‍රලේඛ**

| | | | |
|---|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන චක්‍රලේඛයේ 04 ඡේදය | ඉදිරි වර්ෂයේ පුනරාවර්තන හා ප්‍රාග්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා වන වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 10 දිනට පෙර සකස්කොට ඒ සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අනුමැතිය ලබාගත යුතු වුව ද, 2022 වර්ෂය සඳහා වන ප්‍රසම්පාදන සැලැස්ම තුළ ප්‍රාග්ධන වැඩසටහන් පමණක් ඇතුළත් කර ගණන්දීමේ නිලධාරියා විසින් 2022 ජනවාරි 07 දින අනුමත කර තිබුණි. | 2024 වර්ෂයේ සිට අංක 02/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කිරීමට කටයුතුකරන බව දන්වා තිබුණි. | චක්‍රලේඛය පරිදි කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (iv) රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක **2022/05** | මාර්ගෝපදේශය ප්‍රකාරව වාර්තාකරණ ආයතනයේ වාර්තාවලට අදාළව තොරතුරු නොමැති අවස්ථාවල හිස් වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුව ද, පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය, පොත්වලින් කපා හැරීම පිළිබඳ ප්‍රකාශය සහ අස්ථානගත වවුචර් පිළිබඳ ප්‍රකාශය සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් මූල්‍ය ප්‍රකාශන තුළ හිස් වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් කිරීමට කටයුතුකරන බව දන්වා තිබුණි. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ පරිදි කටයුතු කළ යුතු ය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ක්‍රියාකාරී සැලැස්ම තුළ කෙටිකාලීන මත්ද්‍රව්‍ය නිවාරණ පුහුණු වැඩසටහන් පහක් පළාත් පහක් තුළ පැවැත්වීම, ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ කෙටිකාලීන පුහුණු පාඨමාලා පළාත් නවය තුළ වැඩමුළු නවයක් පැවැත්වීම, මහජන සබඳතාවය හා සන්නිවේදන කුසලතාවය සංවර්ධන වැඩමුළු නවයක් පළාත් නවයක පැවැත්වීමට සැලසුම්කර තිබුණ ද, සමාලෝචිත වර්ෂය තුළ මෙම ක්‍රියාකාරකම් සිදුකර නොතිබුණි. | මෙම පුහුණු වැඩමුළු 2022 දෙවැනි කාර්තුවේ සිට ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කරන ලද අතර 2022 අප්‍රේල් 26 දින නිකුත් කරන ලද අයවැය චක්‍රලේඛ අංක 03/2022 කට අනුව පනවා තිබූ මූල්‍ය සීමාවන්ට යටත්ව මෙම පුහුණු වැඩමුළු නතර කිරීමට සිදුවිය. | සැලසුම්කරන ලද කාර්යයන් සඳහා මූලිකත්වය ලබා දෙමින් කටයුතු කළ යුතු ය. |
| (ආ) | සෞඛ්‍ය අමාත්‍යාංශය එක්ව ප්‍රතිකාර මධ්‍යස්ථාන ඇති කිරීම සඳහා ලංකාව පුරා පවතින රෝහල්වලින් ඌණ උපයෝජිත රෝහල් හඳුනාගෙන මත් නිවාරණ ප්‍රතිකාර ලබාදීමට හැකිවන පරිදි ඒකකයක් සකස්කර ගැනීමට වර්ෂය තුළ සැලැසුම් කළ ද, එය සිදුකර නොතිබුණි. | මෙම දෙපාර්තමේන්තුව මගින් හඳුනාගන්නා ලද ඌණ උපයෝජිත රෝහල් ප්‍රතිකාර මධ්‍යස්ථාන ලෙස වැඩිදියුණු කරදෙන මෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය වෙතින් ඉල්ලීම් සිදුකර ඇති අතර, අධිකරණ රාජ්‍ය අමාත්‍යතුමාගේ දැනුම්දීම පරිදි මේ සම්බන්ධව නැවතත් 2023 ජනවාරි 13 වැනි දින ඉල්ලීමක් යොමුකර ඇති බව දන්වා තිබුණි. | සැලසුම් කරන ලද කාර්යයන් සඳහා මූලිකත්වය ලබා දෙමින් කටයුතු කළ යුතු ය. |

## 3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රජා විශෝධන ක්‍රියාවලියේ නිරත නිලධාරීන්ට තම කටයුතු බාධාවකින් තොරව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ඉඩපහසුකම් හා කාර්යාලීය පහසුකම් ප්‍රමාණවත් පරිදි ලබාදිය යුතු වුව ද, පළාත් 9 කට අදාළව මහේස්ත්‍රාත් අධිකරණවල පිහිටුවා තිබෙන ප්‍රජා විශෝධන කාර්යාල 49 ක ප්‍රමාණවත් ඉඩපහසුකම් නොමැතිවීම හේතුවෙන් ප්‍රජා විශෝධන ක්‍රියාවලිය ඵලදායි අයුරින් ක්‍රියාත්මක කිරීමට බාධාවක් වී තිබුණි. | ප්‍රාදේශීය ප්‍රජා විශෝධන කාර්යාල සඳහා ඉඩ පහසුකම් වෙන්කර ගැනීමට කළ ඉල්ලීමට අදාළව අමාත්‍යාංශ ලේකම් මඟින් ඉංජිනේරු අංශයේ සියළුම ඉංජිනේරුවරුන් දැනුවත් කර ඇත. එමෙන්ම ගොඩනැඟිලි ඉදිකිරීම්වල දී ප්‍රජා විශෝධන දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය ප්‍රජා විශෝධන කාර්යාල සඳහා ඉඩපහසුකම් වෙන්කිරීමට අවශ්‍ය පියවර ගන්නා බව දන්වා ඇති අතර, ප්‍රාදේශීය ප්‍රජා විශෝධන කාර්යාලය මඟින් ලැබෙන ඉල්ලීම් අනුව ඉදිරියේදී කටයුතු කරන බව දන්වා ඇත. | නිලධාරීන්ට තම කටයුතු බාධාවකින් තොරව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පහසුකම් ලබා දිය යුතු ය. |

## 3.3 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේ දී මිලදීගත් රු.246,804 ක් වටිනා විදුලි උපාංග හා සමාලෝචිත වර්ෂයේ දී අපහරණය කරන ලද භාණ්ඩ පිළිබඳ තොරතුරු 2017 ජුනි 28 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2017 හි 7 ඡේදය ප්‍රකාරව කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත වාර්තා කිරීමට කටයුතු කර නොතිබුණි. | 2022 වර්ෂයේ දී මිළදී ගන්නා ලද රු.246,804 ක් වටිනා විදුලි උපකරණ පිළිබද තොරතුරු කොම්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත දැන්වීමට අවශ්‍ය කටයුතු සිදුකරන බවත්, ඉදිරියේදී මිළදී ගන්නා වත්කම් සම්බන්ධයෙන් ද තොරතුරු කොම්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත දැන්වීමට අවශ්‍ය කටයුතු සිදුකරන බවත් දන්වා තිබුණි. | චක්‍රලේඛ පරිදි කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළදී භාණ්ඩ අපහරණයකර තිබූ අතර, එම භාණ්ඩ විකිණීමෙන් ලද සත්‍ය මුදල පිළිබඳ තොරතුරු හා විනාශ කරන ලද භාණ්ඩ පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරිණි. | භාණ්ඩ විකිණීමෙන් ලද මුදල් පිළිබඳව වාර්තාවක් ලබාදීමට කටයුතුකරන බව දන්වා තිබුණි. | අදාල තොරතුරු විගණනයට ලබාදීමට කටයුතු කළ යුතු ය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළදී අපහරණය කරන ලද භාණ්ඩවල ගත් මිල ස්ථාවර වත්කම්වලින් ඉවත්කර නොතිබීම හේතුවෙන් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි දේපල, පිරියත හා උපකරණවල වටිනාකම හා එහි සංචිත වටිනාකමෙහි නිවැරදිතාවය පිළිබඳ විගණනයට සහතික විය නොහැකි විය. | මෙම දෙපාර්තමේන්තුවේ ස්ථාවර වත්කම් ලේඛණය නිසිපරිදි යාවත්කාලීනකර හඳුනා නොගෙන තිබීම හේතුවෙන්, අපහරණය කරන ලද භාණ්ඩවල මිල ස්ථාවර වත්කම්වලින් ඉවත්කිරීමට නොහැකිවී ඇති අතර, මේ වනවිට ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව දන්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි තොරතුරු ඇතුලත් කිරීමට කටයුතු කළ යුතු ය. |

### 3.4 රජයේ නිලධාරීන් ඇප තැබීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| රජයේ නිලධාරීන් ඇප තැබීම පිළිබඳ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙහි 9 වන ඡේදයේ සංශෝධිත මුදල් රෙගුලාසි 880 රජයේ නිලධාරීන්ට ඇප තැබීම පිළිබඳව රාජ්‍ය මුදල් ආදියේ භාරකාරත්වය හා ආරක්ෂාව සම්බන්ධයෙන් වූ වගකීම ගණන්දීමේ නිලධාරියා සතුව පවතින බැවින් නියමිත නිලධාරීන් විසින් ඇප තබන බවට වග බලාගැනීම කළ යුතු යැයි සඳහන් කර තිබුණ ද, මුදල් රෙගුලාසි 315 හි ඇප තැන්පත් කළ යුතු ගණකාධිකාරී, මුදල් අයකැමි හා ගබඩා භාරකරු වැනි තනතුරු දරන නිලධාරීන් අදාළ ඇප මුදල් තැන්පත් කර නොතිබුණි. | ඇප මුදල් තැන්පත් කිරීමට අවශ්‍ය නිලධාරීන් හඳුනාගෙන එම නිලධාරීන්ගෙන් ඇප මුදල් තැන්පත් කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව දන්වා තිබුණි. | චක්‍රලේඛය පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් ඇප තැබීමට කටයුතු කළ යුතු ය. |

### 3.5 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

දෙපාර්තමේන්තුව වෙත නිකුත් කරන ලද පහත සඳහන් විගණන විමසුම් සඳහා 2023 අගෝස්තු 28 දින වන විටත් පිළිතුරු එවා නොතිබුණි.

| විගණන විමසුම් පිළිබඳ විස්තර | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 නොවැම්බර් 11 හා නොවැම්බර් 18 දිනවල දී නිකුත්කරන ලද විගණන විමසුම් **2**ක් සඳහා සඳහා දෙපාර්තමේන්තුව විසින් පිළිතුරු ලබා දී තිබුණ ද, එම විමසුම්වල අදාළ සියලුම නිරීක්ෂණ ආවරණය වන පරිදි පිළිතුරු ලබා දී නොතිබුණි. | 2022 දෙසැම්බර් මස එවකට මෙම දෙපාර්තමේන්තුව විගණනය කරන ලද බන්ධනාගාර මූලස්ථානයේ පවතින ජාතික විගණන උපකාර්යාලයේ විගණන අධිකාරි වෙත විගණන විමසුම් දෙකේ පිළිතුරු සහිත ලිපි දෙකක් භාර දී ඇති බව දන්වා තිබුණි. | විමසුමෙහි අදාළ සියලුම නිරීක්ෂණ ආවරණය වන පරිදි පිළිතුරු ලබාදීමට කටයුතු කළ යුතු ය. |

### 3.6 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල සඳහා 2018 වර්ෂයේ රු. 2,889,145 ක් වැයකර ඇඟිලි සලකුණු යන්ත්‍ර 97 ක් ලබාදී තිබුණ ද, ප්‍රධාන කාර්යාලවලින් පාලනය වන පරිදි ප්‍රාදේශීය කාර්යාලවල තොරතුරු ලබාගැනීමේ දත්ත පද්ධතියක් වැඩි දියුණුකර නොතිබීම හේතුවෙන් ඇඟිලි සලකුණු යන්ත්‍ර ස්ථාපනය කිරීමෙන් අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි. | ප්‍රධාන කාර්යාලයෙන් පාලනය වන පරිදි තොරතුරු ලබාගැනීමේ දත්ත පද්ධතිය වැඩිදියුණු කිරීමට (Centralization of Information System) අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින අතර, එහි මුල් අදියර ලෙස බස්නාහිර පළාතට අයත් ප්‍රාදේශීය කාර්යාල 21 හි කටයුතු මේ වන විට සිදුකරමින් පවතින බව දන්වා තිබුණි. | අපේක්ෂිත අරමුණු ළඟාකර ගැනීමට කටයුතු කළ යුතු ය. |
| **(ii)** | වැඩ තහනම් කර ඇති නිලධාරියෙකුගේ වසර 05 කට වැඩි කාලයක සිට අයවිය යුතු රු.131,020 ක ආපදා හා උත්සව අත්තිකාරම් ශේෂයක්ද මිය ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු වසරකට වැඩි රු.246,443 ක් වූ ආපදා හා උත්සව අත්තිකාරම් ශේෂයක්ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2011 වර්ෂයේ සිට වැඩතහනමට ලක් වී ඇති අදාළ නිලධාරියා වෙනුවෙන් පැවැත්වෙන විධිමත් විනය පරීක්ෂණය මේ වන විට අවසන් වී ඇති අතර, එහි අවසන් වාර්තාව ලබාදීමෙන් අනතුරුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතුකරන බව දන්වා තිබුණි.<br><br>මේ වනවිට රු.246,443 ක මුළු ණය ශේෂය අයකර ගෙන ඇතිබව දන්වා තිබුණි. | ණයශේෂ කඩිනමින් අයකරගැනීමට කටයුතු කළ යුතු ය. |

## 4. යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(i) වගන්තියට අනුව දෙපාර්තමේන්තුව විසින් අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි. | දැනට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් අභ්‍යන්තර විගණක තනතුර සඳහා නිලධාරියෙකු පත් කිරීමට ඉල්ලීම්කර ඇති බව දන්වා තිබුණි. | විගණන පනතට අනුගතව කටයුතු කළ යුතු ය. |

## 5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික ශ්‍රේණිවල පුරප්පාඩු 03 ක් ද, තෘතීයික මට්ටමේ පුරප්පාඩු 19 ක් ද, ද්විතීක මට්ටමේ පුරප්පාඩු 15 ක් ද, ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 6 ක් ද වශයෙන් දෙපාර්තමේන්තුවේ සමස්ත පුරප්පාඩු 43 ක් පැවතිණි. | ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරුවලින් දෙකක් පිරවීම සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත දන්වා ඇති බවත්, දෙපාර්තමේන්තුගත සහකාර කොමසාරිස් තනතුර සඳහා මේ වන විට සුදුසුකම් සපුරන ලද නිලධාරීන් දෙපාර්තමේන්තුව තුළ නොමැති බවත් දන්වා තිබුණි.<br>තෘතීය මට්ටමේ තනතුරු සඳහා බඳවාගැනීමේ කටයුතුකරමින් පවතින බවත්, අනෙකුත් ද්විතීක හා ප්‍රාථමික මට්ටමේ තනතුරු සඳහා බඳවාගැනීමට මාර්ගගත ක්‍රමය ඔස්සේ (PACIS) ඉල්ලුම්කර ඇති බවත් දන්වා තිබුණි. | පුරප්පාඩු තනතුරු සඳහා බඳවාගැනීම කෙරෙහි අවධානය යොමු කළ යුතු වේ. |
| (ආ) | දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ ප්‍රජා විශෝධන නිලධාරී තනතුරු 10 ක් හා පරිපාලන නිලධාරී තනතුරු 01 ක් පිළිවෙලින් 2015 හා 2010 වර්ෂවල සිට පුරප්පාඩුව පවතින අතර, එම නිත්‍ය තනතුරු සඳහා බඳවාගැනීම් පරිපාටින්ට අනුව උසස් කිරීමෙන් හෝ බඳවාගැනීමෙන් තොරව රාජකාරි ඉටුකිරීම සඳහා නිලධාරීන් පත්කර තිබුණි. | ජ්‍යෙෂ්ඨ ප්‍රජා විශෝධන නිලධාරී තනතුරු දහය සඳහා බඳවාගැනීම් සිදුකිරීමට සම්මුඛ පරීක්ෂණ පවත්වා අවසන් කර ඇති අතර, පරිපාලන නිලධාරී තනතුර සඳහා බඳවාගැනීමට මාර්ගගත ක්‍රමය ඔස්සේ (PACIS) ඉල්ලුම්කර ඇතිබව දන්වා තිබුණි. | පුරප්පාඩු සඳහා ස්ථිර නිලධාරීන් අනුයුක්ත කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතු වේ. |